සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

### 09 ශ්‍රේණිය

### නාට්‍ය හා රංග කලාව - I පත්‍රය

කාලය:- පැය 02 යි.

නම / විභාග අංකය:-...............................................................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- 1 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

(01) නාට්‍ය පෙළක අන්තර්ගත නොවන්නේ,

(1) රංග විධාන (2) චරිත (3) ගැටුම් අවස්ථා (4) රූපණය

(02) රංග වස්ත්‍ර නිර්මාණය අයත් අභිනය වන්නේ,

(1) සාත්වික අභිනය (2) ආහාර්ය අභිනය (3) වාචික අභිනය (4) ආංගික අභිනය

(03) ''පරිකල්පනය'' යනු,

(1) සිතින් මවා ගැනීමය (2) ඉදිරියට පැමිණවීමයි (3) රූප ඉදිරිපත් කිරීමයි (4) අදහස් හුවමාරුවයි

(04) ලෝක ධර්ම් නාට්‍ය ශෛලියට අයත් නාට්‍යයක් වන්නේ,

(1) කැළණි පාලම (2) මනමේ (3) කදා වළලු (4) සිංහබාහු

(05) ''ශරීරාංග සැහැල්ලු කිරීම'' නම් ක්‍රියාවලිය සිදුවන රංග අභ්‍යාස වර්ගය වනුයේ,

(1) කටහඬ අභ්‍යාස (2) ශරීරය උණුසුම් කිරීමේ අභ්‍යාස

(3) ශිථිලකරණ අභ්‍යාස (4) නම්‍යශීලි අභ්‍යාස

(06) සති පිරිත් පිංකම අවසානයේ යෙදෙන නාට්‍යමය ලක්ෂණ ඇතුලත් බෞද්ධ පූජා කර්මය වනුයේ,

(1) දොරකඩ අස්නය (2) මිලින්ද ප්‍රශ්නයයි

(3) ආලවක දමනයයි (4) කරරෝම-රුවිරෝම දමනයයි

(07) කතාන්දරයක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීමේදී අත්‍යවශ්‍ය නොවන්නේ,

(1) විචිත්‍ර වර්ණ රංග වස්ත්‍රයෙන් සැරසීමයි (2) පැහැදිලි වචන උච්ඡාරණයයි

(3) අවකාශ භාවිතයයි (4) සතර අභිනය භාවිතයයි

(08) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතාගේ **ජාතක කතාවක් ඇසුරින් කල** නාට්‍ය නිර්මාණයක් වන්නේ,

(1) මනමේ (2) වෙල්ල වැහුම් (3) කපුවා කපෝති (4) සිංහබාහු

(09) ''මුහුදු පතුල යට ඉදලා'' නම් ගීතය අයත් නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

(1) දයානන්ද ගුණවර්ධන (2) ගුණසේන ගලප්පත්ති (3) රංජිත් ධර්මකීර්ති (4) එදිරිවීර සරත්චන්ද්‍ර

(10) අනුශාංගික අංග නිර්මාණයේදී සැලකිය යුතු කරුණක් නොවන්නේ,

(1) නාට්‍ය අයත් ශෛලිය　　(2) නාට්‍ය අයත් යුගය

(3) නළුවාගේ රංගන කාර්යය　　(4) ප්‍රේක්ෂකයාගේ දේශපාලන මතය

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි නම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද යොදන්න

(11) නාට්‍යයක් සඳහා ගැටුම අත්‍යවශ්‍ය නොවේ (　　)

(12) සමාරෝපය ප්‍රධාන වශයෙන් කොටස් 2කි (　　)

(13) එකම චරිතයක් තුල ඇත්තේ එකම භූමිකාවකි (　　)

(14) නාට්‍ය ධර්මී ක්‍රමය තුල ප්‍රබල පසුතල නිර්මාණ දැකිය හැකිය (　　)

(15) නළුවාගේ කාර්යය රූපණයයි (　　)

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට හිස්තැන් පුරවන්න

(16) ................................ තාල අනුව නරිබෑණා නාට්‍යයේ දෙබස් රචනා වී ඇත

(17) ''මිලිඳු රජු'' හා ''නාගසේන හිමි'' නම් චරිත අයත් බෞද්ධ පූජා කර්මය .................................. යි

(18) ''සකස්කඩ'' භාවිත කරන්නේ....................................... අභ්‍යාස ප්‍රගුණ කිරීමටයි

(19) ශරීරයේ අඟ පසඟ භාවිතයෙන් අදහස් ප්‍රකාශ කිරීම අයත් වන්නේ...................................... අභිනයටයි

(20) පවතින ලෝක ස්වභාවයට වඩාත් නැඹුරුව අදහස් ප්‍රකාශ කිරීම................................... නාට්‍ය ක්‍රමයේදී දැකිය හැකිය

(ලකුණු 2×20=40)

සියලුම හිමිකම් ඇව්රිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

09 ශ්‍රේණිය

නාට්‍ය හා රංග කලාව - II පත්‍රය

නම / විභාග අංකයඃ-..............................................................

- පළමු ප්‍රශ්නය ඇතුලු තවත් ප්‍රශ්න 3කට පිළිඅතුරු සපයන්න

(01) එදිරිවීර සරත්චන්ද්‍රයන් විසින් රචනා කර නිෂ්පාදනය කළ කදා වළලු නාට්‍ය අදටත් ජනප්‍රිය වේ. එම නාට්‍ය පිටපත ඇසුරු කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

(1) කදා වළලු නාට්‍ය රඟ දක්වන විට රංග භූමියට පැමිණෙන චරිත නම් කරන්න (ලකුණු 3)

(2) කදා වළලු නාට්‍යයේ තේමාව සඳහන් කරන්න (ලකුණු 3)

(3) කදා වළලු නාට්‍ය අයත් වන්නේ කුමන ශෛලියටද? (ලකුණු 3)

(4) කදා වළලු නාට්‍යයේ ගැටුම ගොඩනැගෙන්නේ කුමන චරිත අතරද? (ලකුණු 3)

(5) සිටු දියණිය දූන් රන්තලියට කච්ජපුට ලබා දුන්නේ කුමක්ද? (ලකුණු 3)

(02)

(1) නාට්‍යයක සංවාද යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 4)

(2) නාට්‍යවල ඇති සංවාද බෙදිය හැකි වර්ග 2 ලියන්න (ලකුණු 5)

(3) නාට්‍යයක සංවාද මගින් ලබා ගතහැකි ප්‍රයෝජන 3ක් ලියන්න (ලකුණු 6)

(03)

(1) සමාරෝපය යනු කුමක්ද? (ලකුණු 4)

(2) එහි කොටස් නම් කර හඳුන්වන්න (ලකුණු 5)

(3) රඟපෑමේදී සමාරෝපයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න (ලකුණු 6)

(04)

(1) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත නාට්‍ය ප්‍රභේද නම් කරන්න (ලකුණු 4)

(2) එයින් ඔබ කැමති නාට්‍ය ප්‍රභේදයකට අයත් නාට්‍ය 5ක් නම් කරන්න (ලකුණු 5)

(3) නාට්‍ය ධර්මී නාට්‍යවල ලක්ෂණ 3ක් ලියන්න (ලකුණු 6)

(05)

(1) අභිනය සතර නම් කරන්න (ලකුණු 4)

(2) ඉන් ඔබ කැමති අභිනය දෙකක් ගැන හැඳින්වීමක් කරන්න (ලකුණු 5)

(3) රූපණය සඳහා සතර අභිනයේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න (ලකුණු 6)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

09 ශ්‍රේණිය

නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

(01) 4
(02) 2
(03) 1
(04) 1
(05) 3
(06) 1
(07) 1
(08) 1
(09) 2
(10) 4
(11) ×
(12) ✓
(13) ×
(14) ×
(15) ✓
(16) රබන් පද , සවුදම්
(17) මිලින්ද ප්‍රශ්නය
(18) කටහඬ අභ්‍යාස
(19) ආංගික අභිනය
(20) ලෝක ධර්මී

(ලකුණු 2×20=40)

### II පත්‍රය

(01)

(1) මිත්තණිය, සිටු දියණිය, සේරිවාණිජ, කච්ඡපුට
(2) දැඩි තෘෂ්ණාව(ලෝභය) විනාශයට හේතුවන බව
දැඩි තෘෂ්ණාව දුකට හේතුවන බව
(3) නාට්‍යධර්මී ශෛලියට
(4) සිටු දියණිය හා සේරිවාණිජ අතර
සේරිවාණිජ හා කච්ඡපුට අතර
(5) කහවනු දහසක් හා වළලු කඳ

(02)

(1) නාට්‍යයක සංවාද යනු චරිත විසින් කරනු ලබන ප්‍රකාශයන්ය
(2) ලෝකධර්මී සංවාද හා නාට්‍යධර්මී සංවාද
(3) අදහස් හුවමාරු කර ගැනීම
කථාව ප්‍රකාශ කිරීම
චරිත හඳුනා ගැනීම (බාහිරව හඳුනා ගැනීම, අභ්‍යන්තරව හඳුනා ගැනීම)
කථාව ඉදිරියට රැගෙන යාම
චරිතවල හැඟීම් හඳුනා ගැනීම
ප්‍රේක්ෂකයාට රසයක් ලබාදීම

(03)

(1) සමාරෝපය යනු වෙනත් චරිතයකට ආරෝපණය වීමයි

(2) අභ්‍යන්තර සමාරෝපය - අභිනය මගින් චරිතය ප්‍රකාශ කිරීම

බාහිර සමාරෝපය - චරිතය බාහිරව පෙන්වීම (උදා: අංග රචනය රංග වස්ත්‍ර මගින්)

(3) චරිතය මැනවින් නිරූපණය කිරීමට හැකිවීම

ප්‍රේක්ෂකයන්ට චරිතය මැනවින් හඳුනා ගැනීමට හැකිවීම

නළුවාට රඟපෑම පහසු වීම

(04)

(1) ලෝකධර්මී - නාට්‍යධර්මී

(2) ලෝකධර්මී - කැළණි පාලම, තට්ටු ගෙවල්, බෝඩිංකාරයෝ, තලමල පිපිලා, කනේරු මල්

නාට්‍යධර්මී - මනමේ, සිංහබාහු, දික්තල කාලගෝල, මහාසාර, හුණුවටය

(3) නාට්‍ය ධර්මී නාට්‍යවල ලක්ෂණ 3ක්

- තාලානුකූල නර්තනාකූල ගමන් තාල යොදා ගැනීම
- සංවාද සංගීතාත්මක වීම
- මනුස්ස නොවන චරිත පවා දක්නට ලැබීම
- පසුතල ප්‍රධාන නොවීම

(05)

(1) ආංගික අභිනය - වාචික අභිනය

ආහාර්ය අභිනය - සාත්වික අභිනය

(2) සිසුවා විස්තර කර ඇති අයුරු බලා නිවැරදිතාවය අනුව ලකුණු දෙන්න

(3) සිසුවා පැහැදිලි කර ඇති අයුරු විමසා බලා ලකුණු දෙන්න